**මන්මුනේ ප්‍රාදේශීය සභාව - 2023**
**----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මන්මුනේ ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මන්මුනේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම )

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීම , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතී රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ විකුණනු ලැබූ වර්ග 14ක වත්කම් ඒකක 69ක වටිනාකම එම වත්කම්වල පිරිවැයෙන් අඩුකර දක්වා නොතිබුණි. | ඉදිරි වර්ෂයේ ප්‍රකාශනවලින් මෙම වටිනාකම අඩුකර දක්වන බව. | ඉවත්කළ වත්කම්වල වටිනාකම ගිණුම්වලින් අඩුකර දැක්විය යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී සභාවේ පුස්තකාල 06ක් සඳහා පරිත්‍යාග ලෙස ලැබී තිබුණු වටිනාකම ගණනය නොකළ පොත් 127ක් සහ වටිනාකම රු.288,726ක්වූ පොත් 499ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉදිරියේදී ගිණුම්ගත කරන බව. | පරිත්‍යාග ලද පොත් මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස දැක්විය යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයේ පාරිභෝගික ද්‍රව්‍ය තොග රු. 203,225ක් සහ ලිපිද්‍රව්‍ය තොග රු. 135,343ක් මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස දක්වා නොතිබුණි. | ඉදිරියේදී තොගයේ වටිනාකම ගිණුම්වල ඇතුළත් කරන බව. | තොගය, මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස දැක්විය යුතුය. |
| (ඈ) | සභාවේ ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානය විසින් නිපදවා විකිණීමට සූදානම් කළ රු.187,500ක් වූ කාබනික පොහොර තොග කි. ග්‍රෑම් 15,000ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉදිරියේදී මෙම තොගයේ වටිනාකම ගිණුම්වල ඇතුළත් කරන බව. | අවසාන පොහොර තොගය, ගිණුම්වල දැක්විය යුතුය. |

**1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| ඉදිරිපත් නොකළ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු.69,642,923ක් වූ ගිණුම් ශේෂ 04කට අදාල ස්ථාවර වත්කම් ලේඛනය, හිමිකාරිත්වය සනාථ කිරීම් ලේඛන, අත්තිකාරම් ලේඛනය සහ අනෙකුත් ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි, පිරියත, මෝටර් රථ, ගෘහභාණ්ඩ ආදියෙහි වටිනාකම තක්සේරු කිරීමට සහ වාහනවල අයිතිය පවරා ගැනිමටත් කටයුතු කරනු ලබන බව. | වත්කම්වලට අදාල ලිඛිත සාක්ෂි ලබාගැනීමට සහ ලේඛනවල ඇතුළත් කිරීමටත් පියවර ගත යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට ආදියට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2021 ඔක්තෝබර් 12 දිනැති අංක 2249/13 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ 6(2) රෙගුලිසිය | -- | සභාවේ අනියම් පදනමින් සේවය කරන සෞඛ්‍ය කම්කරුවන් 13කට සේවක අර්ථ සාධක අරමුදල් සාමාජික කාඩ්පත "බී" ලබාගැනීමට පියවර ගෙන නොතිබුණි. | සභාවේ අනියම් පදනමින් සේවය කරන සෞඛ්‍ය කම්කරුවන් 13ක් සඳහා සේවක අර්ථ සාධක අරමුදල් සාමාජික කාඩ්පත "බී" ලබාගැනීමට පියවර ගනු ලබන බව. | ගැසට් පත්‍රයේ විධිවිධාන ප්‍රකාර කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 ජූලි 26 දිනැති අංක 03/2018 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය | 691,769 | පසුගිය වර්ෂ 08ක සිට අක්‍රීයව පවතින ලංකා බැංකු ජංගම ගිණුම වසා දැමීමට පියවර ගෙන නොතිබුණි. | සන අපද්‍රව්‍ය සම්බන්ධයෙන් ආරම්භ කළ නිල බැංකු ගිණුම මෙම වර්ෂයේ වසා දමන බව. | අක්‍රීය බැංකු ගිණුම් වසා දැමීමට පියවර ගත යුතුය. |
| (ඇ) | 2018 ඔක්තෝබර් 10 දිනැති අංක 03/2018 දරන දේපළ කළමනාකරණ චක්‍රලේඛය | -- | සභාවේ භාවිතයේ පවතින ටොන් 05ක් බරැති ගල් රෝලෙහි හිමිකරු සොයාගත නොහැකි අවස්ථාවක රථයේ ලියාපදිංචිය පිළිබඳ විස්තර මෝටර්රථ ප්‍රවාහන කොමසාරිස්වරයාගෙන් ලබාගැනීමට පියවර ගෙන නොතිබුණි. | රථයේ ලියාපදිංචිය පිළිබඳව මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ලබාගැනීමට පියවර ගන්නා බව. | රථයේ අයිතිය පවරා ගැනීමට පියවර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 10,155,483 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 18,381,968ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව සභාව විසින් ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම | රැස්කළ ආදාය | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදාය | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 4,600,000 | 4,932,591 | 3,945,100 | 987,497 | 2,210,000 | 3.242.960 | 3,280,635 | 525,197 |
| කුලී | 12,150,000 | 12,955,302 | 11,531,555 | 1,423,747 | 9,644,600 | 9,378,800 | 8.083,000 | 1,861,447 |
| බලපත්‍ර ගාස්තු | 1,770,000 | 2,205,005 | 2,205,005 | - | 1,895,000 | 1,554,690 | 1,554,690 | - |
| වෙනත් ආදායම් | 74,639,433 | 56,185,404 | 52,889,229 | 3,296,175 | 28.020,000 | 48,057,170 | 48,355,585 | 3.430,939 |
| එකතුව | 93,159,433 | 76,278,302 | 70,570,889 | 5,707,419 | 41,769,600 | 62,233,620 | 61,273,910 | 5,817,583 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ පිහිටි ගොඩනැගිලිවලින් අයවිය යුතු වරිපනම් රු.722,939ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | අයකර ගැනීමට පියවර ගෙන ඇති බව. | හිඟහිටි ආදායම් නොපමාව අයකළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට කුලීහිමියන් 34කගෙන් අයවිය යුතු හිඟහිටි කුලී හා බදුකුලී ආදායම් පිළිවෙලින් රු.371,797ක් සහ රු.865,250ක් විය. | හිඟහිටි ශේෂ අයකර ගැනීමට පියවර ගනු ලබන බව. | -එම- |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | සභාවේ අරමුදලින් 2018 වර්ෂයේ රු.314,000ක් වැයකර මිලදීගෙන සභාවේ එවකට සිටි ලේකම්වරයෙකුගේ නමින් ලියාපදිංචි කළ ට්‍රේලරය සහ වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල නමින් පැවැති වාහන 12ක අයිතිය සභාවේ නමට මාරුකිරීමට පියවර ගෙන නොතිබුණි. | වාහන සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කරන බව. | වත්කම්වල අයිතිය නිරවුල් විය යුතුය. |

### 3.2 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ කාර්යමණ්ඩල සංඛ්‍යාවට අනුව සභාවේ පුරප්පාඩු 15ක් පැවැතුණි. | මාසිකව කාර්ය මණ්ඩල විස්තර වාර්තාව පළාත් පාලන කාර්යාලය සහ සහකාර පළාත්පාලන කාර්යාලයට යවන බව. | තනතුරු පිරවීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | සභාව විසින් පවත්වනු ලබන පරිගනක පුහුණු මධ්‍යස්ථානයේ 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂ අවසානය දක්වා සිසුන් 2,710ක් අනුයුක්ත කර තිබුණි. මෙම පාඨමාලාවෙන් රු.9,123,840ක ආදායමක් ලැබී තිබූ නමුත් 2016 වර්ෂයේ සිට තාවකාලිකව අනුයුක්ත කළ තොරතුරු සන්නිවේදන තාක්ෂණ පුහුණුකරුවන් සඳහා ස්ථිර තනතුරක් ස්ථාපිත කර අනුමත කර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | තොරතුරු සන්නිවේදන තාක්ෂණ පුහුණුකරු තනතුර සඳහා අප ගේ සාධාරණීකරණය සහිතව ස්ථාපිත කිරීමට ඉදිරිපත් කර ඇති බව. | පුහුණුකරු සඳහා ස්ථිර තනතුරක් ස්ථාපිත කර අනුමත කර ගැනීමට පියවර ගත යුතුය. |
| (ඇ) | විශ්‍රාම ගිය පිරිපහදු කම්කරුවන් දෙදෙනෙකුගෙන් සහ මියගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු හිඟ ණය ශේෂ රු.258,343ක් වර්ෂ 02කට අධික කාලයක සිට අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | දෙදෙනෙකු ගේ හිඟ ණය අයකිරීමට පියවර ගෙන ඇති බව. | සේවක හිඟ ණය අයකිරීමට පියවර ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වාර්ෂික අයවැය ප්‍රකාරව, සභාව විසින් ක්‍රියාත්මක කළයුතු ක්‍රියාකාරකම් 30ක් සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර නොතිබුණි. | ඔබගේ උපදෙස් පරිදි ඉදිරියේදී වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කරන බව. | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීමට පියවර ගතයුතුය. |